© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

(1)

3225

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019

**PE0110 (PE710)** අධ්‍යාපන මනෝවිද්‍යාව
EDUCATIONAL PSYCHOLOGY

2019.09.21 පැය 0900 - පැය 1200 කාලය - පැය තුනයි.

උපදෙස් :-

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.

---

I කොටස    විභාග අංකය:..............................

...ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.

01. පුද්ගල අධ්‍යයන ක්‍රමයක් වශයෙන් නිරීක්ෂණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.

- නිරීක්ෂණයට ලක් වන පුද්ගලයාට තමා නිරීක්ෂණයට ලක් වන බව නොදැනෙන සේ නිරීක්ෂණය කිරීම.
- නිරීක්ෂකයා තමා ඉදිරියේ පෙනී සිටීම නිසා ස්වභාවික චර්යා වසන් කිරීමට උත්සාහ කිරීම.
- නිරීක්ෂකයා නිරීක්ෂණයට ලක් වන සමූහයේ සාමාජිකයකු බවට පත් වී නිරීක්ෂණය කිරීම.

ඉහත ප්‍රකාශවලින් විස්තර වන නිරීක්ෂණයට භාවිත කරන නිරීක්ෂණ ක්‍රම අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. සහභාගී නිරීක්ෂණය, වක්‍ර නිරීක්ෂණය, ඍජු නිරීක්ෂණය
2. ඍජු නිරීක්ෂණය, වක්‍ර නිරීක්ෂණය, සහභාගී නිරීක්ෂණය
3. වක්‍ර නිරීක්ෂණය, ඍජු නිරීක්ෂණය, සහභාගී නිරීක්ෂණය
4. වක්‍ර නිරීක්ෂණය, සහභාගී නිරීක්ෂණය, ඍජු නිරීක්ෂණය (........)

02. ගුරුවරයකු විසින් පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා සිසුන්ගේ චතුර්විධ භාෂා හැකියා සංවර්ධනය වන ආකාරය පරීක්ෂා කිරීම සඳහා පළමුවන ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් කණ්ඩායමක් වසරින් වසර පස්වන ශ්‍රේණිය දක්වා ම අධ්‍යයනය කර, තොරතුරු වාර්තා කරන ලදී.

මෙහි දී මෙම ගුරුවරයා විසින් භාවිත කොට තිබෙන අධ්‍යයන ක්‍රමය වන්නේ,

1. සම්පරීක්ෂණ අධ්‍යයන ක්‍රමය යි.
2. හරස්කඩ අධ්‍යයන ක්‍රමය යි.
3. සායනික අධ්‍යයන ක්‍රමය යි.
4. අන්වායාම අධ්‍යයන ක්‍රමය යි. (........)



අ.පි.බ.

03. අනන්‍ය නිවුන් දරුවන් හා සම්බන්ධ පහත දක්වා ඇති ප්‍රකාශය හා හේතුව සැලකිල්ලට ගන්න.

ප්‍රකාශය - අනන්‍ය නිවුන් දරුවන්ගේ ප්‍රවේණික ගැලපුම් සමාන බැවින් රූප ලක්ෂණ හා ගති ලක්ෂණ එක හා සමාන වන අතර, එක ම ලිංගයකට ද අයත් වේ.

හේතුව - එකම සංසේචිත ඩිම්බයක් සර්වසම කොටස් දෙකකට බෙදීමෙන් අනන්‍ය නිවුන් දරුවන් ඇති වේ.

මේ පිළිබඳ ව පහත සඳහන් වගන්ති අතරින් නිවැරදි වගන්තිය තෝරන්න.

1. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය මනාව පැහැදිලි කරයි.
2. ප්‍රකාශය හා හේතුව සත්‍ය වන අතර හේතුව මගින් ප්‍රකාශය හොඳින් පැහැදිලි නොකරයි.
3. ප්‍රකාශය හා හේතුව අතර කිසිදු සම්බන්ධතාවක් නොමැත.
4. ප්‍රකාශය හා හේතුව යන වගන්ති දෙක ම අසත්‍ය වේ. (........)

04. ළමා සංවර්ධනය පිළිබඳ ව ඉදිරිපත් ව තිබෙන මූලධර්මයක් වන්නේ පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් ද?

1. ළමා සංවර්ධන අවධි අනුපිළිවෙළ හැම පුද්ගලයා සම්බන්ධව ම ඒකාකාරී නොවේ.
2. ළමා සංවර්ධන වේගය හැම පුද්ගලයාගේ ම එක හා සමාන වේ.
3. ළමා සංවර්ධනය විශේෂ ප්‍රතිචාරයේ සිට සාමාන්‍ය ප්‍රතිචාරය දක්වා ගමන් කරයි.
4. ළමා සංවර්ධනය හැම පුද්ගලයා සම්බන්ධව ම අඛණ්ඩ ව සිදුවන ක්‍රියාවලියකි. (........)

05. පියාජේගේ බුද්ධි සංවර්ධන න්‍යායට අනුව ප්‍රජානන සංවර්ධනය සිදු වන්නේ,

1. ළමයා තුළ සිදුවන පරිණත ක්‍රියාවලිය අනුව ය.
2. ආරයෙන් උරුම වන ශක්තීන් අනුව ය.
3. ඉපදීමෙන් පසු ජීවියා හා පරිසරය අතර ඇති වන සම්බන්ධතාව අනුව ය.
4. ළමා සංවර්ධනයේ විවිධ පැතිකඩ සමඟ සහසම්බන්ධතාව අනුව ය. (........)

06. A හා B යන ශිෂ්‍යයන් දෙදෙනා චින්තනය මෙහෙයවන ආකාරය පිළිබඳ සඳහන් පහත ප්‍රකාශ වෙත අවධානය යොමු කොට මොවුන් පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව අයත් වන සංවර්ධන අවධි කවරේ දැ'යි තෝරන්න.

A – බාහිර ලෝකය සංකේත මගින් නියෝජනය කරමින් චින්තනයේ යෙදෙයි.

B – ද්‍රව්‍යවලින් පරිබාහිර ව චින්තනය මෙහෙයවයි.

1. A ඉන්ද්‍රිය චාලක අවධියට අයත් අතර, B වියුක්ත ක්‍රියාකාරී අවධියට අයත් වේ.
2. A පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියට අයත් අතර, B වියුක්ත ක්‍රියාකාරී අවධියට අයත් වේ.
3. A ඉන්ද්‍රිය චාලක අවධියට අයත් අතර, B සංයුක්ත ක්‍රියාකාරී අවධියට අයත් වේ.
4. A පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියට අයත් අතර, B සංයුක්ත ක්‍රියාකාරී අවධියට අයත් වේ.

(........)

07. පහත දැක්වෙන මනෝවිද්‍යාත්මක සංකල්ප, ඒවා අයත් වන ඉගෙනුම් න්‍යාය සමඟ නිවැරදි අනුපිළිවෙළින් ගළපා තිබෙන පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| ඉහළ පටිපාටිවල ආරෝපණය | A - ප්‍රකාරක ආරෝපණ න්‍යාය |
| අනුකරණයෙන් ඉගෙනුම | B - ගෙස්ටෝල්ට් න්‍යාය |
| ප්‍රතිවේදී ඉගෙනුම | C - සමාජ ඉගෙනුම් න්‍යාය |
| ඉගෙනුම සඳහා ප්‍රශංසා ලැබීම | D - සම්භාව්‍ය ආරෝපණ න්‍යාය |
| | E - තැත්වරද න්‍යාය |

1. CEAB 2. DCAB 3. DCBA 4. EDBA (........)

08. ගාඩ්නර් විසින් ඉදිරිපත් කළ ව්‍යුහමය ආකෘති න්‍යාය මගින් බුද්ධිමය කුසලතා ලගා කර ගැනීමේ ධුරාවලියක් ඉදිරිපත් කොට ඇත. එහි ඉහළ ම මට්ටමේ බුද්ධිමය කුසලතාව ලෙස දක්වා ඇත්තේ,
1. සම්බන්ධතා දාම ය.
2. රීති හා මූලධර්ම ය.
3. ගැටලු විසඳීම ය.
4. සංකල්ප සාධනය ය. (........)

09. තාත්තා යන සංකල්පය සාධනයේ දී "සෑම තාත්තා කෙනෙකු ම පිරිමියෙකු බව වටහා ගැනීම" සංකල්ප සාධන ක්‍රියාවලියේ දී හඳුන්වන්නේ,
1. සංජානනය ලෙස ය.
2. සාමාන්‍යකරණය ලෙස ය.
3. විභේදනය ලෙස ය.
4. සංවිධානය ලෙස ය. (........)

10. පළමුවන ශ්‍රේණියේ දරුවන්ට "පෙරහැර නම් සංකල්පය" සාධනය කරවීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් පහත දැක්වේ.
X – දරුවන්ට පෙරහැර පිළිබඳ වාචික ව විස්තරයක් ඉදිරිපත් කිරීම.
Y – පෙරහැරක පින්තූරයක් පෙන්වා ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම.
Z – දරුවන් සමඟ පෙරහැරක් යාම.
සංකල්ප සාධනය පිළිබඳ බෲනර් විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී අත්දැකීම්, ප්‍රතිමාරූපී අත්දැකීම් සහ සංකේතාත්මක අත්දැකීම් සමඟ අනුපිළිවෙළින් නිවැරදි ව ඉහත ක්‍රියාමාර්ග සමඟ ගළපන ලද පිළිතුර තෝරන්න.
1. ZYX
2. YXZ
3. XYZ
4. XZY (........)

11. අටවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු පිළිබඳ ව ගුරුවරයෙක් තබන ලද සටහනක් පහත දැක්වේ.
"ශිවා පංති කාමරයේ ඉගෙනුම් කටයුතුවල දී බොහෝ විට අනෙක් ශිෂ්‍යයන් දක්වන අදහස්වලට වඩා වෙනස් වූ නව අදහස්, තර්ක ඉදිරිපත් කරයි. නව විෂය කරුණු සොයාගෙන ඒවා පංතියට ඉදිරිපත් කරයි."
ඉහත සටහනට අනුව ශිවා,
1. අපසාරී චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
2. අභිසාරී චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
3. වියුක්ත චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
4. නිර්මාපී චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි. (........)

12. "ගයාත්‍රී පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දීප්තිමත් ශිෂ්‍යාවකි. ඇය දැනට ඉගෙනුම ලබන පංතියට වඩා ඉහළ පංතිවල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා සමාන ව ක්‍රියාකාරකම්වල නිරතවීමටත්, චින්තනය මෙහෙයවීමටත් හැකියාව ඇත." මේ අනුව ගයාත්‍රීගේ බුද්ධිඵලය පිළිබඳ ව එළඹිය හැකි නිගමනය කවරක් ද?
1. 100ට ආසන්න අගයකි.
2. 100ට අඩු අගයකි.
3. 130ට වැඩි අගයකි.
4. 50-75 අතර අගයකි. (........)

13. හොවාර්ඩ් ගාඩ්නර් බුද්ධිය පිළිබඳ ව ඉදිරිපත් කළ අදහස් පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි අවස්ථාවක් සඳහා වඩාත් ගැළපෙන උදාහරණය වන්නේ පහත සඳහන් අවස්ථා අතරින් කවරක් ද?
1. ප්‍රාප්ත ව සිටින සංවර්ධන අවධියට ගැළපෙන ඉගෙනුම් ක්‍රියාමාර්ග තෝරා ගැනීම
2. ශිෂ්‍ය සංවර්ධන මට්ටමට ගැළපෙන ඉගැන්වීම් ක්‍රම හා ක්‍රමශිල්ප භාවිත කිරීම
3. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ක්‍රීඩා, සෞන්දර්ය, සාහිත්‍ය වැනි විවිධ අංග ඇතුළත් කිරීම
4. ශිෂ්‍ය බුද්ධි සංවර්ධනයට ඉඩ සැලසෙන සරු පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම

(........)

08. ගාන්යේ විසින් ඉදිරිපත් කල වැදගත් ආකෘති හතර මගින් බුද්ධිමය කුසලතා ලබා කර ගැනීමේ ධූරාවලියක් ඉදිරිපත් කොට ඇත. එහි ඉහළ ම මට්ටමේ බුද්ධිමය කුසලතාව ලෙස දක්වා ඇත්තේ,

1. සම්බන්ධතා දාම ය.
2. රීති හා මූලධර්ම ය.
3. ගැටලු විසඳීම ය.
4. සංකල්ප සාධනය ය. (........)

00. තාන්ත්‍රික ගත සංකල්පය සාධනයේ දී "සෑම තාන්ත්‍රික කෙනෙකු ම පිළිමයකු මෙන් වීනා ගැනීම" සංකල්ප සාධන ක්‍රියාවලියේ දී හඳුන්වන්නේ,

1. සංජානනය ලෙස ය.
2. සාමාන්‍යකරණය ලෙස ය.
3. විභේදනය ලෙස ය.
4. සංවිධානය ලෙස ය. (........)

10. පළමුවන ශ්‍රේණියේ දරුවන්ට "පෙරහැර නම් සංකල්පය" සාධනය කිරීම සඳහා ගුරුවරයෙකුට අනුගමනය කල හැකි ක්‍රියාකාරකම් තුනක් පහත දැක්වේ.

X – දරුවන්ට පෙරහැර පිළිබඳ වාචික ව විස්තරයක් ඉදිරිපත් කිරීම.

Y – පෙරහැරක පින්තූරයක් පෙන්වා ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම.

Z – දරුවන් සමඟ පෙරහැරක් යාම.

සංකල්ප සාධනය පිළිබඳ බෲනර් විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී අත්දැකීම්, ප්‍රතිමාරූපී අත්දැකීම් සහ සංකේතාත්මක අත්දැකීම් සමඟ අනුපිළිවෙලින් නිවැරදි ව ඇති ක්‍රියාමාර්ග සමඟ ගලපන ලද පිළිතුර තෝරන්න.

1. ZYX 2. YXZ 3. XYZ 4. XZY (........)

අටවන ශ්‍රේණියේ ඉගෙනුම් ලබන ශිෂ්‍යයකු පිළිබඳ ව ගුරුවරයෙක් තබන ලද සටහනක් පහත දැක්වේ.

"ඔහු පංති කාමරයේ ඉගෙනුම් කටයුතුවල දී බොහෝ විට අනෙක් ශිෂ්‍යයන් දක්වන අදහස්වලට වඩා වෙනස් වූ නව අදහස්, තර්ක ඉදිරිපත් කරයි. නව විෂය කරුණු සොයාගෙන ඒවා පංතියට ඉදිරිපත් කරයි."

ඉහත සටහනට අනුව ඔහු,

1. අපසාරී චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
2. අභිසාරී චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
3. වියුක්ත චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.
4. නිර්මාණ චින්තනයෙන් යුතු ශිෂ්‍යයෙකි.

(........)

"ගයානි පස්වන ශ්‍රේණියේ ඉගෙනුම් ලබන දීප්තිමත් ශිෂ්‍යාවකි. ඇය දැනට ඉගෙනුම් ලබන පංතියට වඩා ඉහළ පංතිවල ඉගෙනුම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා සමාන ව ක්‍රියාකාරකම්වල නිරතවීමටත්, චින්තනය මෙහෙයවීමටත් හැකියාව ඇත." මේ අනුව ගයානිගේ බුද්ධිඵලය පිළිබඳ ව එළඹිය හැකි නිගමනය කවරක් ද?

1. 100ට ආසන්න අගයකි.
2. 100ට අඩු අගයකි.
3. 130ට වැඩි අගයකි.
4. 50-75 අතර අගයකි. (........)

හොවාඩ් ගාඩ්නර් බුද්ධිය පිළිබඳ ව ඉදිරිපත් කල අදහස් පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට යොදා ගත හැකි අවස්ථාවක් සඳහා වඩාත් ගැලපෙන උදාහරණය වන්නේ පහත සඳහන් අවස්ථා අතරින් කවරක් ද?

1. ප්‍රාප්ත ව සිටින සංවර්ධන අවධියට ගැලපෙන ඉගෙනුම් ක්‍රියාමාර්ග තෝරා ගැනීම
2. ශිෂ්‍ය සංවර්ධන මට්ටමට ගැලපෙන ඉගැන්වීම් ක්‍රම හා ක්‍රමශිල්ප භාවිත කිරීම
3. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ක්‍රීඩා, සෞන්දර්ය, සාහිත්‍ය වැනි විවිධ අංශ ඇතුළත් කිරීම
4. ශිෂ්‍ය බුද්ධි සංවර්ධනයට ඉඩ සැලසෙන සරු පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීම

14. පෞරුෂ සංවර්ධනය පිළිබඳ ගති ලක්ෂණ න්‍යාය පෝෂණය කිරීමට දායක වූ මනෝවිද්‍යාඥයින් කණ්ඩායම අයත් පිළිතුර තෝරන්න.

1. ෆ්‍රොයිඩ්, කැටෙල්, අයිසෙන්ක්
2. ෆ්‍රොයිඩ්, අයිසෙන්ක්, රොජර්ස්
3. ඕල්පොට්, කැටෙල්, රොජර්ස්
4. ඕල්පොට්, කැටෙල්, අයිසෙන්ක් (........)

15. ශ්‍යාමන් වයස අවුරුදු 15ක ළමයෙකි. ඔහු හැදී වැඩෙන්නේ ආච්චි අම්මා ළඟ ය. ඔහුගේ මව මිය ගොස් ඇති අතර පියා නැවත විවාහ වී වෙන් ව ජීවත් වේ. ශ්‍යාමන් පංතියේ සිටින වෙනත් ශිෂ්‍යයන් සමඟ නිරන්තර ගැටුම් ඇති කර ගන්නා අතර ඉක්මනින් කෝපයට ද පත් වේ. ශ්‍යාමන්ගේ මෙම චර්යාමය ස්වභාවය විශ්ලේෂණය කිරීම සඳහා ඉවහල් කර ගත හැකි උචිත ම ප්‍රවේශය මින් කුමක් ද?

1. චර්යාවාදී ප්‍රවේශය
2. මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශය
3. ප්‍රජානන ප්‍රවේශය
4. මනෝවිද්‍යාත්මක ප්‍රවේශය (........)

16. මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය මගින් ප්‍රකාශිත මූලධර්මයක් **නොවන්නේ** පහත ප්‍රකාශ අතරින් කුමක් ද?

1. පුද්ගලයන් විවිධ කාර්ය සඳහා පෙලඹෙන්නේ අවශ්‍යතා තෘප්ත කර ගැනීමට ය.
2. එක් අවශ්‍යතාවක් පැන නැඟෙන්නේ වෙනත් අවශ්‍යතාවක් තෘප්ත වූ පසුව ය.
3. අවශ්‍යතා අතරින් වඩාත් ප්‍රබල අවශ්‍යතාව වන්නේ ආත්ම සාර්ථකත්ව අවශ්‍යතාව ය.
4. අවශ්‍යතාවල ප්‍රබලතාව අනුව අනුක්‍රමාධිපත්‍ය ව්‍යුහයක් ගොඩනැගිය හැකි ය. (........)

17. මධුර තාල රටාවන් සහිත ව අතීතයේ දී නිර්මාණය වූ ගීත සඳහා එම තාල රටාව අනුගමනය කරමින් නව පදමාලාවක් සහිත ව ගීත නිර්මාණය වුව ද බොහෝ දෙනාගේ මතකයේ රැඳී තිබෙන්නේ පැරණි පද මාලාව යි. මෙලෙස නව ගීතයේ පදමාලාව අමතක වීම විග්‍රහ කිරීමට ඉවහල් කර ගත හැකි වඩාත් උචිත අමතක වීම පිළිබඳ න්‍යාය කුමක් ද?

1. අන්‍යොන්‍ය නිරෝධන මතය
2. ස්මෘති ලාංජන පිළිබඳ මතය
3. අවරෝධනය පිළිබඳ මතය
4. ස්මෘති ලාංජන කාලීන ව වෙනස්වීම පිළිබඳ මතය (........)

18. ඉගෙනුම් ආධාරක සකස් කිරීමේ දී ගුරුවරයකු විසින් සැලකිල්ලට ගත යුතු ශිෂ්‍ය අවධානය රඳවා ගැනීම පිළිබඳ විෂය බද්ධ සාධකයක් වන්නේ කුමක් ද?

1. බුද්ධි මට්ටම
2. අවශ්‍යතා
3. ප්‍රමාණය
4. ගති පුරුදු (........)

19. පහත දැක්වෙන චර්යාමය ලක්ෂණ හා ගැළපෙන විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය කාණ්ඩය අනුපිළිවෙළින් දක්වා තිබෙන පිළිතුර තෝරන්න.

- නිතර ම අත් පා නොසන්සුන් ව චලනය කරයි. අපේක්ෂිත කාලයක් වාඩිවී සිටීමට අපහසු ය.
- ඉක්මනින් කෝප වෙයි. හුදකලාව සිටීමට වැඩි කැමැත්තක් දක්වයි.
- පුද්ගලයන්ගේ දෑස දෙස බලා කතා කළ නොහැකි ය. අවාචික සන්නිවේදනයේ දී දුර්වලතා දක්වයි.

1. ඔටිසම්, අධි ක්‍රියාකාරී, චිත්තවේගීය ගැටලු සහිත
2. චිත්තවේගීය ගැටලු සහිත, ඔටිසම්, අධි ක්‍රියාකාරී
3. අධි ක්‍රියාකාරී, චිත්තවේගීය ගැටලු සහිත, ඔටිසම්
4. අධි ක්‍රියාකාරී, ඔටිසම්, චිත්තවේගීය ගැටලු සහිත (........)

20. ශිෂ්‍යයන්ගේ පෞද්ගලික අනන්‍යතාව සුරක්ෂිත කරමින් ඔවුන්ට යෝග්‍ය ඉගෙනුම් පරිසරයක් සාමාන්‍ය පංති කාමරය තුළ ගොඩනැගීමේ අධ්‍යාපන ක්‍රමය හඳුන්වන්නේ,

1. අන්තර්කරණ අධ්‍යාපනය ලෙස ය.
2. විශේෂ අධ්‍යාපනය ලෙස ය.
3. ඒකීයකරණ අධ්‍යාපනය ලෙස ය.
4. විධිමත් අධ්‍යාපනය ලෙස ය. (........)

(ලකුණු 1 x 20 = ලකුණු 20)

© ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනය (සියලු හිමිකම් ඇවිරිණි/All Rights Reserved)



ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)
## අවසාන පරීක්ෂණය - 2019
## PE0110 (PE710) - අධ්‍යාපන මනෝවිද්‍යාව

II කොටස

ප්‍රශ්න හතරට පමණක් පිළිතුරු සපයන්න.

01. අධ්‍යාපන මනෝවිද්‍යාව විෂය ක්ෂේත්‍රය ගවේෂණ ඔබ මේ වන විට විවිධ පුද්ගල අධ්‍යයන ක්‍රම ඇතුළත් ව මනෝවිද්‍යාත්මක සංකල්ප රැසක් පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබෙන අතර, ඒවා ගුරු භූමිකාව සඳහා අදාළ කර ගත හැකි ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීම බෙහෙවින් වැදගත් කාරණයකි.

(i) අධ්‍යාපන මනෝවිද්‍යාව යනු කුමක් දැ'යි නිර්වචනය කර, එය පෝෂණය වීම සඳහා උපකාරී වූ වෙනත් මනෝවිද්‍යා උප ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) මනෝවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රමයක් වශයෙන් ප්‍රකෘතික අධ්‍යයන ක්‍රමය කෙටියෙන් හඳුන්වා, එය සිසුන්ගේ සම්බන්ධ ව තොරතුරු රැස් කිරීමට භාවිත කළ හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ගුරුවරයකු වශයෙන් පාඩම් සැලසුම් සකස් කිරීමේ දී හා ඒවා ක්‍රියාවට නංවන විට දී අධ්‍යාපන මනෝවිද්‍යාත්මක සංකල්ප ඔබට ඉවහල් කර ගත හැකි අවස්ථා හතරක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

ළමා සංවර්ධන ක්‍රියාවලිය පැහැදිලි ව ළමා සංවර්ධන අවධි ව්‍යුහයක් නිර්මාණය කිරීමට විවිධ මනෝවිද්‍යාත්මක ප්‍රවාද දායක වී ඇත.

(I) නව යොවුන් වියේ පසුවන සිසුන් වෙතින් ප්‍රදර්ශනය වන ප්‍රධාන අවශ්‍යතා තුනක් ලියන්න. (ලකුණු 03)

(II) පුද්ගල සංවර්ධනය පිළිබඳ ව සිග්මන් ෆ්‍රොයිඩ් විසින් දක්වා තිබෙන මනෝලිංගික සංවර්ධන අවධි පහ නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

(III) නව යොවුන් වියේ පසුවන සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 08)

03. ප්‍රජානන ඉගෙනුම් න්‍යාය කාණ්ඩයට අයත් වන ගෙස්ටෝල්ට් න්‍යායේ අන්තර්ගත මූලධර්ම පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී විශාල මඟපෙන්වීමක් කරනු ලැබේ.

(i) චර්යාවාදී ඉගෙනුම් න්‍යායන්ට සාපේක්ෂ ව ප්‍රජානන ඉගෙනුම් න්‍යායන්ගේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ගෙස්ටෝල්ට් න්‍යායවාදීන් ප්‍රකාශ කළ ආකාරයට සංජානනය කෙරෙහි බලපාන විශේෂ බද්ධ සාධක පහක් රූපසටහන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ගෙස්ටෝල්ට් ඉගෙනුම් න්‍යාය පිළිබඳ අවබෝධය පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී භාවිත කර ගත හැකි ආකාර හතරක් උචිත උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08)

04. "ගුරු භූමිකාවට අදාළ ප්‍රධාන කාර්යයක් වශයෙන් සිසුන් තුළ යහපත් පෞරුෂ ගුණාංග සංවර්ධනයට දායක වීම දැක්විය හැකි ය."

(i) පෞරුෂ සංකල්ප තුළ අන්තර්ගත සුවිශේෂී ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන පෞරුෂ ගුණාංගයක් වන මෘදු කුසලතා (Soft Skills) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? සෑම ශිෂ්ටසම්පන්න සමාජයකට ම පොදු වන මෘදු කුසලතා හයක් ලියා දක්වන්න. (ලකුණු 06)

(iii) පෞරුෂ සංවර්ධන න්‍යායයන් පිළිබඳ ව ඔබ ලබා ගත් අවබෝධය පදනම් ව සිසුන් තුළ යහපත් පෞරුෂ ගුණාංග දියුණු කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. (ලකුණු 06)

05. අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් යොමු කරවන බලවේගයක් වශයෙන් අභිප්‍රේරණය හඳුන්වා දිය හැකි ය.

(i) අභිප්‍රේරණය පිළිබඳ ව මැක්ඩූගල්ගේ සහජ ලැදියා න්‍යාය මඟින් හඳුන්වා දුන් සහජ ලැදියා තුනක් හඳුන්වන්න. (ලකුණු 0

(ii) අභිප්‍රේරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කර, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු

(iii) අභිප්‍රේරණය සම්බන්ධ ව ඉදිරිපත් ව පවතින න්‍යායන්ගේ අන්තර්ගත ප්‍රධාන මූලධර්ම ඉ
සඳහා සිසු අභිප්‍රේරණය ඉහළ නැංවීමට භාවිත කර ගත හැකි අවස්ථා හතරක් ද
ඔස්සේ සිසු අභිප්‍රේරණය සිදුවන ආකාරය විස්තර කරන්න. (ලකුණු

06. සිසු ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා ස්මෘති ක්‍රියාවලියේ ස්වභාවය සහ ස්මෘති අවධි පිළිබඳ පැහැදිලි අවබෝධයක් ගුරුවරයකු තුළ පැවතීම වැදගත් වේ.

(i) ස්මෘති ක්‍රියාවලියේ ප්‍රධාන අදියර තුන කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු

(ii) ස්මෘති අවධි යටතට ගැනෙන කෙටිකාලීන ස්මෘතිය යන්න හඳුන්වා, එයට තොරතුරු ... ප්‍රධාන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු

(iii) සිසු ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා භාවිත කර ගත හැකි ක්‍රම ශිල්ප හතරක් ... උගන්වන විෂය ක්ෂේත්‍ර ආශ්‍රිත උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු

07. "ලඟා කර ගත යුතු අවසාන ඉලක්ක තිබිය දී ඒවා ලඟා කර ගැනීමට සුදුසු ක්‍රම විද්‍යමාන නොවන විට ගැටලු පැන නගියි."

(i) ගැටලු විසඳීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **තුනක්** හඳුන්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු විසඳීම සඳහා භාවිතයට ගැනෙන විද්‍යාත්මක ක්‍රමයේ ප්‍රධාන පියවර **පහ** නම් කර, ඒවා කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍යයන් තුළ ගැටලු විසඳීමේ හැකියාව සංවර්ධනය කිරීම සම්බන්ධ ගුරු කාර්යභාරය කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 08)

08. පංති කාමර ඉගැන්වීම් කටයුතුවල දී සුහග හා විශිෂ්ට කුසලතා පෙන්වන ශිෂ්‍යයන් විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් වශයෙන් හඳුනා ගැනීම මෙන් ම ඔවුන් ඉදිරි පෝෂණයට ලක් කිරීම සෑම ගුරුවරයකුගේ ම වගකීමකි.

(i) "විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්" නම් සංකල්පය අර්ථකථනය කර, විශේෂ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) සුහග හා විශිෂ්ට කුසලතා දක්වන ශිෂ්‍යයන්ට පාසල එපා වීමට හෝ පාසල් අධ්‍යාපනය පිළිබඳ සෘණාත්මක සිතිවිලි පැන නැගීමට බලපෑ හැකි හේතු **පහක්** කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ඔබේ පංති කාමරය තුළ ඉගෙනුම ලබන සුහග ශිෂ්‍යයන්ගේ හැකියා තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ඔබගේ විෂය ඉගැන්වීම් පරාසය තුළ අනුගමනය කළ හැකි ඉදිරි පෝෂණ ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08)

********